සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

**දෙවන වාර පරීක්ෂණය - 2025**
**Second Term Test - 2025**

| 9 ශ්‍රේණිය | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | කාලය පැය 01 යි. මි. 30 |
|---|---|---|

නම/ විභාග අංකය:

## I - කොටස

- **සියලුම ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 10 දක්වා ප්‍රශ්න සඳහා වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(01) වෙබ් අඩවි සැලසුම් කිරීම හා සංවර්ධන කාර්යය ඉටු කරනු ලබන පුද්ගලයා හඳුන්වන නාමය වන්නේ,

(1) ජාල පරිපාලක (2) පද්ධති විශ්ලේෂක (3) ක්‍රමලේඛක (4) වෙබ් සංවර්ධක

(02) දත්ත හා වැඩසටහන් ස්ථිරව තැන්පත් කිරීමට යොදා ගනු ලබන උපාංග හඳුන්වනු ලබන නාමය වන්නේ,

(1) ආදාන උපාංග (2) ආචයන උපාංග (3) ප්‍රතිදාන උපාංග (4) සන්නිවේදන උපාංග

(03) ආදාන උපාංගයක් නොවන්නේ,

(1) යතුරු පුවරුව (2) මූසිකය (3) සුපරික්ෂකය (4) මුද්‍රණ යන්ත්‍රය

(04) පරිගණක ජාලගත කිරීම සඳහා පහත කුමන කෙවෙනිය භාවිතා කරයි ද?

(1) ජාල කෙවෙනිය (2) සන්නිවේදන කෙවෙනිය

(3) USB කෙවෙනිය (4) PS2 කෙවෙනිය

(05) පරිගණකයක් මිලදී ගැනීමේදී සැලකිය යුතු තාක්ෂණික නොවන පිරිවිතරයක් වන්නේ?

(1) ප්‍රධාන මතකයේ ධාරිතාවය (2) දෘඪ තැටියේ ධාරිතාවය

(3) නිෂ්පාදන වගකීම (4) තිරයේ ප්‍රමාණය

(06) සකසනයක් තුළ පවතින මධ්‍ය සැකසුම් ඒකක ප්‍රමාණය අනුව සකසන වර්ගීකරණයට අයත් නොවන්නේ,

(1) Single Core (2) Dual Core (3) Third Core (4) Quad Core

(07) ජංගමව භාවිත කළ හැකි පරිගණකයක් නොවන්නේ,

(1) සියල්ලම එකක පරිගණකය (2) උකුළු පරිගණකය

(3) නෝට්බුක් පරිගණකය (4) සුහුරු දුරකථනය

(08) ප්‍රධාන මතකයේ ධාරිතාවය මනිනු ලබන්නේ?

(1) GHz (2) GB (3) bits (4) Mbps

(09) නිදහස් විවෘත මෙහෙයුම් පද්ධතියකි,

(1) LINUX (2) WINDOWS 8 (3) MAC OS (4) OPERA

(10) වඩාත් ප්‍රචලිත සකසන නිෂ්පාදන සමාගමක් වන්නේ,

(1) DUAL (2) PENTIUM (3) AMD (4) CORE

(ලකුණු 2 x 10 = 20)

Past Papers Wiki

## II - කොටස

(01) පහත දී ඇති ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

(i) පරිගණකයක් ඇසුරෙන් ඉටුකර ගත හැකි පරිශීලක අවශ්‍යතා දෙකක් සඳහන් කරන්න.

........................................................................................................................

........................................................................................................................

(ii) පරිගණකයක් මිලදී ගැනීමේදී සකසනයේ හා සංදර්ශකයේ තිබිය යුතු පිරිවිතර එක බැගින් ලියා දක්වන්න.

........................................................................................................................

........................................................................................................................

(iii) නිෂ්පාදන තාක්ෂණය අනුව සංදර්ශක වර්ග දෙකක් ලියා දක්වන්න.

........................................................................................................................

........................................................................................................................

(iv) USB කෙවෙනියට සම්බන්ධ කළ හැකි ආවයන උපක්‍රම දෙකක් නම් කරන්න.

........................................................................................................................

........................................................................................................................

(v) නිශ්චිත ස්ථානයක තබා භාවිතා කළ හැකි පරිගණක වර්ග දෙකක් සඳහන් කරන්න.

........................................................................................................................

........................................................................................................................

(ලකුණු 5 x 2 = 10)

(02) පහත දක්වෙන්නේ පාසල් පරිගණක විද්‍යාගාරය සඳහා මිලදී ගත් භාණ්ඩ සඳහා ගිය වියදම ගණනය කිරීම සඳහා සකසා ඇති පැතුරුම්පතක කොටසකි. ඒ ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| | A | B | C | D | E |
|---|---|---|---|---|---|
| 1 | භාණ්ඩ මිලදී ගැනීම් විස්තරය | | | | |
| 2 | අංකය | අයිතමය | ඒකක මිල | ප්‍රමාණය | වියදම |
| 3 | 1 | CD | Rs. 80.00 | 20 | Rs. 1,600.00 |
| 4 | 2 | DVD | Rs. 100.00 | 20 | Rs. 2,000.00 |
| 5 | 3 | KEY BOARD | Rs. 850.00 | 5 | Rs. 4,250.00 |
| 6 | 4 | POWER CABLE | Rs. 350.00 | 10 | Rs. 3,500.00 |
| 7 | 5 | MOUSE | Rs. 550.00 | 5 | Rs. 2,750.00 |
| 8 | එකතුව | | | | Rs. 14,100.00 |

(i) තැටි මිලදී ගැනීම සඳහා වැය වන වියදම E3 කෝෂයට ලබා ගැනීම සඳහා එහි ලිවිය යුතු සූත්‍රය ලියන්න.

........................................................................................................................

(ii) භාණ්ඩ මිලදී ගැනීම සඳහා යන මුළු වියදම E8 කෝෂයට ලබා ගැනීම සඳහා ලිවිය යුතු ශ්‍රිතය නිවැරදිව සඳහන් කරන්න.

........................................................................................................................

(iii) මිලදී ගත් භාණ්ඩ අතරින් වැඩිම ඒකක මිලක් සහිත භාණ්ඩයේ ඒකක මිල C8 කෝෂයට ලබා ගැනීමට එහි ලිවිය යුතු ශ්‍රිතය සඳහන් කරන්න.

........................................................................................................................

(iv) B8 කෝෂයෙහි =COUNT(A3:B7) යන ශ්‍රිතය ඇතුලත් කළ විට ලැබෙන අගය කුමක් ද?

........................................................................................................................

(v) මෙම සටහනෙහි පළමු වන පේළියේ අකුරු සඳහා යොදාගෙන ඇති හැඩසව් කිරීම් දෙකක් ලියා දක්වන්න.

........................................................................................................................

........................................................................................................................

(ලකුණු 5 x 2 = 10)

(03) 1 සිට 10 දක්වා ඇති ඉරට්ටේ සංඛ්‍යා ප්‍රතිදානය කර ගැනීම සඳහා සකස් කර ඇති පහත සඳහන් අසම්පූර්ණ ගැලීම් සටහනෙහි A සිට F දක්වා ස්ථාන වලට අදාල වගන්ති වරහන් තුළින් තෝරා අදාල හිස්තැන මත ලියන්න.

(සංඛ්‍යාව 10 හෝ 10 ට අඩුද?, ආරම්භය, සංඛ්‍යාව ප්‍රතිදානය කරන්න, සංඛ්‍යාවට දෙකක් එකතු කරන්න, ඔව්, නැත)




A. ..........................................

B. ..........................................

C. ..........................................

D. ..........................................

E. ..........................................

F. ..........................................

(ලකුණු 5 x 2 = 10)

(04) පහත A හා B තීරු සුදුසු පරිදි යා කරන්න.

**A**

(1) කොන්දේසියකට අනුව අවස්ථා දෙකක් අතරින් එක් අවස්ථාවක් තෝරා ගැනීම.
(2) නිශ්චිත වාර ගණනක් පුනර්කරණය කිරීම.
(3) කොන්දේසියක් සත්‍ය වන තුරු පුනර්කරණය කිරීම.
(4) අසීමිත වාර ගණනක් පුනර්කරණය කිරීම.
(5) අගයන් ඕනෑම ප්‍රමාණයක් තනි නාමයකින් තැන්පත් කිරීමට යොදා ගනී.

**B**

- Array (අරාව)
- repeat until
- repeat
- forever
- Simple Selection (සරල තේරීම)

(ලකුණු 5 x 2 = 10)

(05) ඕනෑම සංඛ්‍යාවක 12 වන ගුණාකාරය දක්වා අගයයන් ප්‍රතිදානය කිරීම සඳහා නිර්මාණය කළ වැඩසටහනක් පහත දැක්වේ. එහි A සිට E දක්වා අක්ෂර දක්වා ඇති ස්ථාන වලට අදාල වචන වරහන් තුළින් තෝරා ලියන්න.

{answer, ගුණිතය, 1, වාර ගණන, සංඛ්‍යාව කීයද?}

A. ..........................................

B. ..........................................

C. ..........................................

D. ..........................................

E. ..........................................




(ලකුණු 5 x 2 = 10)

Past Papers Wiki

(06) පහත සඳහන් ප්‍රශ්න සඳහා සුදුසු පිළිතුරු ලියන්න.

(i) ක්ෂුද්‍ර පාලකයක අන්තර්ගත කොටස් දෙකක් නම් කරන්න.

..............................................................................................................

..............................................................................................................

(ii) ක්ෂුද්‍ර පාලක සහිත මෙවලම් කට්ටල දෙකක් නම් කරන්න.

..............................................................................................................

..............................................................................................................

(iii) ක්ෂුද්‍ර පාලක භාවිත වන උපකරණ දෙකක් ලියා දක්වන්න.

..............................................................................................................

..............................................................................................................

(iv) සංවේදකයක් යනු කුමක් ද?

..............................................................................................................

..............................................................................................................

(v) වර්තමානයේ භාවිත වන Arduino පුවරු වර්ග දෙකක් නම් කරන්න.

..............................................................................................................

..............................................................................................................

(ලකුණු 5 x 4 = 20)

(07) පහත දක්වෙන Arduino uno පුවරුවෙහි අංකනය කර ඇති කොටස් වරහන් තුළින් සුදුසු වචන යොදා නම් කරන්න

{සංඛ්‍යාංක තුඩු, ප්‍රතිසම තුඩු, DC විදුලි සැපයුම, Power Pins, MINI USB}




1. ..........................................

2. ..........................................

3. ..........................................

4. ..........................................

5. ..........................................

(ලකුණු 5 x 2 = 10)



සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

## පිළිතුරු පත්‍රය I - කොටස

(01) 4 (02) 2 (03) 4 (04) 1 (05) 3

(06) 3 (07) 1 (08) 2 (09) 1 (10) 3 (2 x 10 = 20)

## II - කොටස

(01) (i) ලිපි ලේඛන සැකසීම, අන්තර්ජාලයට පිවිසීම වැනි නිවැරදි පිළිතුරු 02 ක්.

(ii)
- සකසනයේ පිරිවිතර - සකසනයේ වේගය, සකසන නිෂ්පාදන සමාගම, සකසනයේ වර්ගය
- සංදර්ශකයේ පිරිවිතර - සංදර්ශකයේ, සංදර්ශකයේ තාක්ෂණය (පිරිවිතර එක බැගින්)

(iii) කැතෝඩ කිරණ නළ සංදර්ශකය (CRT), ද්‍රව ස්ඵටික සංදර්ශකය (LCD), ආලෝක විමෝචක සංදර්ශකය (LED)

(iv) සැණෙලි ධාවකය, මතක කාඩ්පත්

(v) වැඩහල් පරිගණක, මේස පරිගණක, සේවාදායක පරිගණක, සියල්ලම එකක පරිගණක

(2 x 5 = 10)

(02) (i) =C3*D3 (ii) =SUM(E3:E7)

(iii) =MAX(C3:C7) (iv) 5

(v) Merge and center, Bold, Italic

(5 x 2 = 10)

(03) A - ආරම්භය (ල. 02) B - සංඛ්‍යාව 10 හෝ 10 ට අඩුද? (ල. 02)

C - සංඛ්‍යාව ප්‍රතිදානය කරන්න. (ල. 02) D - සංඛ්‍යාවට දෙකක් එකතු කරන්න. (ල. 02)

E - නැත (ල. 01) F - ඔව් (ල. 01)

(2 x 5 = 10)

(04)

| | A | B |
|---|---|---|
| (1) | කොන්දේසියකට අනුව අවස්ථා දෙකක් අතරින් එක් අවස්ථාවක් තෝරා ගැනීම. | Array (අරාව) |
| (2) | නිශ්චිත වාර ගණනක් පුනර්කරණය කිරීම. | repeat until |
| (3) | කොන්දේසියක් සත්‍ය වන තුරු පුනර්කරණය කිරීම. | repeat |
| (4) | අසීමිත වාර ගණනක් පුනර්කරණය කිරීම. | forever |
| (5) | අගයන් ඕනෑම ප්‍රමාණයක් තනි නාමයකින් තැන්පත් කිරීමට යොදා ගනී. | Simple Selection (සරල තේරීම) |



(ලකුණු 5 x 2 = 10)

(05) A - සංඛ්‍යාව කීයද? B - answer C - ගුණිතය D - වාර ගණන E - 1

(2 x 5 = 10)

(06) (i) මධ්‍ය සැකසුම් ඒකකය, මතකය, පද්ධති හෝරාව, පර්යන්ත උපාංග

(ii) micro:bit, Arduino, Raspberry pi

(iii) රෙදි සෝදන යන්ත්‍රය, ක්ෂුද්‍ර තරංග උඳුන, සූර්ය බල පහන, රථවාහන සංඥා පහන්, පරිගණක මුද්‍රක, දුරස්ථ පාලක

(iv) බාහිර පරිසරයේ සිදුවන වෙනස්වීම් වලට අදාළ මිනුම් ස්වයංක්‍රීයව ලබා ගැනීමට භාවිත කෙරෙන උපකරණයකි.

(v) Arduino Uno, Arduino Mega, Arduino Nano, Arduino Micro

(5 x 4 = 20)

(07) (i) MINI USB (ii) DC විදුලි සැපයුම (iii) Power Pins

(iv) ප්‍රතිසම තුඩු (v) සංඛ්‍යාංක තුඩු

(5 x 2 = 10)

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi
Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Paper Bank